# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2024 අගෝස්තු මස 23 වන දින

## II වන කොටස

## අතිරේකය

## (2024.08.28 දින නිකුත් කරන ලදී)

### ජාතික ගමනාගමන කොමිෂන් සභා (සංශෝධන)

**1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 48.00 තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

***2 වන වගන්තිය :*** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ දීර්ඝ නාමය මේ වගන්තිය මගින් සංශෝධනය කරනු ලබන අතර, ඒ සංශෝධනය 16 වන වගන්තිය මගින් IIඅ වන කොටසේ සිදු කරන ලද සංශෝධනයට ආනුෂංගික වන අතර සංශෝධිත පරිදි වූ ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ, බස් රථ සේවාවලට පමණක් සීමා නොකර සියලු ප්‍රවාහන සේවා සම්බන්ධයෙන් සභාවේ කර්තව්‍යයන්වල විෂයය පථය ප්‍රසාරණය කිරීම වේ.

***3 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් මාර්ගස්ථ ප්‍රවාහන සේවා ප්‍රකාරව පනතේ විෂයය පථය නිශ්චිතව දක්වමින් සහ මාර්ගස්ථ ප්‍රවාහන සේවාව වැඩි දියුණු කිරීම සඳහා වන ප්‍රමිතීන් සහ නිර්ණායක සඳහා විධිවිධාන සලස්වමින් ප්‍රධාන ප්‍රඥප්තියේ පූර්විකාව සංශෝධනය කරනු ලැබේ.

***4 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 1අ වන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලැබේ. මේ අලුත් වගන්තිය මගින් සපයන සේවා, පවත්වාගෙන යා යුතු ප්‍රමිති සහ පනවන දණ්ඩන ආනුෂංගවලට අදාළව පනතේ පරමාර්ථ සඳහා විධිවිධාන සලස්වනු ලැබේ.

***5 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ පවත්නා පොදු ප්‍රවාහන අවශ්‍යතා සපුරාලමින් කොමිෂන් සභාවේ කර්තව්‍යයන්වල විෂයය පථය ප්‍රසාරණය කිරීම සහ සපයනු ලබන සේවා වැඩි දියුණු කිරීම සඳහා විධිවිධාන සැලසීම වේ

***6 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය 16 වන වගන්තිය මගින් IIඅ වන අලුත් කොටස ඇතුළත් කිරීමට ආනුෂංගික වේ.

***7 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය 16 වන වගන්තිය මගින් ඇතුළත් කරන IIඅ වන අලුත් කොටසට ආනුෂංගික වේ.

***8 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ -

(1) මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රයකට අදාළ කාරණා සම්බන්ධයෙන් බලයලත් තැනැත්තකුගේ තීරණයට එරෙහිව කොමිෂන් සභාවට අභියාචනයක් ඉදිරිපත් කිරීමේ කාලසීමාව වැඩි කිරීම; සහ

(2) ඒ වගන්තියේ පැති සටහන ආදේශ කිරීම,

වේ.

***9 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ, කොමිෂන් සභාවේ තීරණයට එරෙහිව ඉදිරිපත් කරන අභියාචනයේ කාලසීමාව වැඩි කිරීම වේ.

***10 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ, මගී ප්‍රවාහන සේවා අවසර පත්‍ර නිකුත් කිරීම සඳහා වඩා හොඳ ඇගයීමේ නිර්ණායක සඳහා විධිවිධාන සැලසීම වේ.

***11 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 24අ වන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලැබේ. අලුත් වගන්තිය මගින් තාවකාලික අවසර පත්‍රයක් නිකුත් කිරීම සඳහා විධිවිධාන සැලසීම සිදු වේ.

***12 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ, අවම ප්‍රමිතිවලට අනුකූල වීම සඳහා සහ මගීන්ගේ ආරක්ෂාව සහ පහසුව සහතික කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***13 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර, ප්‍රතියෝජනය කළ පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ, බස් රථයේ සන්තකය පවරන අවස්ථාවේ දී මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රයේ පැවරීම සඳහා විධිවිධාන සැලසීම වේ.

***14 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ මේ වගන්තියේ නීතිය බලපෑම වනුයේ, මේ වගන්තිය යටතේ අලුත් කරනු ලබන අවසර පත්‍රයක් යටත් වන්නේ කවර කොන්දේසිවලට ද එකී කොන්දේසිවලට තවදුරටත් වූ කොන්දේසි එකතු කිරීම වේ.

***15 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ මේ වගන්තියේ නීතිය බලපෑම වනුයේ, මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රයක් ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කිරීම, අවසර පත්‍රය අලුත් කිරීම, මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රයක් අවලංගු කිරීම හෝ අවසර පත්‍රයක් ප්‍රදානය කිරීම යටත් වන්නා වූ කොන්දේසි පැනවීම යන කොමිෂන් සභාවේ තීරණයට එරෙහිව අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනා කිරීමේ කාලසීමාව වැඩි කිරීම සහ ඒ වගන්තියේ පැති සටහන ඉවත් කර ආදේශ කිරීම වේ.

***16 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට අලුත් කොටසක් (IIඅ වන කොටස) ඇතුළත් කරනු ලැබේ. මේ අලුත් කොටස මගින් අන්තර් පළාත් බස් රථ සේවා නොවන අන්තර් පළාත් වශයෙන් ක්‍රියාත්මක වන ප්‍රවාහන සේවා නියාමනය සඳහා සහ 34අ වන අලුත් වගන්තිය (ප්‍රවාහන සේවා ප්‍රකාශයට පත් කිරීම සහ ලියාපදිංචිය), 34ආ වන වගන්තිය (ප්‍රවාහන සේවා වර්ග කිරීම සහ සහතිකයක් නිකුත් කිරීම), 34ඇ වන වගන්තිය (සහතික පත්‍රය වින්ඩ්ස්ක්‍රීනයේ ප්‍රදර්ශනය කළ යුතු බව) සහ 34ඈ වන වගන්තිය (පනතේ IIඅ වන කොටස යටතේ වන අභියාචන) ඇතුළත් කිරීම සඳහා විධිවිධාන සලසනු ලැබේ.

***17 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ, අධිකරණය මගින් වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ හෝ මහෙස්ත්‍රාත්වරයකු විසින්, නියෝග කරන ලද මුදල් අරමුදලට ගෙවීම සඳහා පහසුකම් සැලැස්වීම වේ.

***18 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ, කොමිෂන් සභාවේ ගිණුම් විගණනය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

**19 වන වගන්තිය :** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 38අ වන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලැබේ. මේ අලුත් වගන්තිය මගින් ප්‍රවාහන සේවා ගාස්තු ගණනය කිරීම සඳහා විධිවිධාන සැලසීම සිදු කරනු ලැබේ.

**20 වන වගන්තිය :** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට අලුත් වගන්ති ඇතුළත් කරනු ලැබේ. 38ආ වන අලුත් වගන්තිය මගින් බස් රථ සේවා සහ ප්‍රවාහන සේවා අධීක්ෂණය කිරීමට කොමිෂන් සභාවට නියම කරනු ලැබේ, 38ඇ වන වගන්තිය මගින් පුහුණු මධ්‍යස්ථානයක් පිහිටුවීමට විධිවිධාන සලස්වනු ලබන අතර, 38ඈ වන වගන්තිය මගින් ආචාර ධර්ම සංග්‍රහයට විධිවිධාන සලස්වනු ලැබේ.

**21 වන වගන්තිය :** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර, ප්‍රතියෝජනය කරන ලද පරිදි වූ ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ, අවසර පත්‍ර දරන්නන්ට විධාන නිකුත් කිරීමට හැකියාව ලබා දීම සහ ඒ නියෝගවලට අදාළ අභියාචනා කාර්යපටිපාටියට ඉඩ සැලසීම වේ.

***22 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 39අ වන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලැබේ. මේ අලුත් වගන්තිය මගින් දණ්ඩන ඇතුළත් කිරීම සඳහා විධිවිධාන සලසනු ලැබේ.

***23 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ, අවම දඩය වැඩි කිරීම, උපරිම දඩයක් පැනවීම සහ බන්ධනාගාරගත කිරීමේ කාලසීමාව අඩු කිරීම වේ.

***24 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ, නියෝග සාදනු ලැබිය හැකි කාරණා වැඩි කිරීම වේ.

***25 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 46උෟ වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ, මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රයක් ලබා ගැනීමට සුදුසුකම් ලැබීමට ඇතැම් මාර්ග සඳහා වැඩි දියුණු කළ පහසුකම් සැලසීම වේ.

***26 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තියෙහි "නියම කරන ලද", "පළාත", පළාත් සභාව", "ප්‍රවාහන ගාස්තු", "ප්‍රවාහන සේවා", "ප්‍රවාහන රථය" සහ "වාහනය" යන අලුත් අර්ථ නිරූපණ ඇතුළත් කරමින් සහ "නිශ්චිත ප්‍රදේශය" යන අර්ථ නිරූපණය සංශෝධනය කිරීමෙන් ඒ වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

ජාතික ගමනාගමන කොමිෂන් සභා
(සංශෝධන)

එල්.ඩී.-ඕ. 9/2021

**1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

*ලුහුඬු නාමය*

**1.** මේ පනත 2024 අංක      දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*1991 අංක 37 දරන පනතේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම*

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ දීර්ඝ නාමය, එහි "බස් රථ මගින් මගී ප්‍රවාහනය" යන වචන වෙනුවට, "මාර්ගස්ථ ප්‍රවාහනය" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ පූර්විකාව සංශෝධනය කිරීම*

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ පූර්විකාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (අ) ඡේදයේ "බස් සේවයක්" යන වචන වෙනුවට, "අන්තර් පළාත් බස් රථ සේවාවක්" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (අ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(අඅ) අමාත්‍යවරයා විසින් ප්‍රකාශ කරනු ලැබිය හැකි පරිදි බස් රථ සේවා, කාර්යාල ප්‍රවාහන සේවා, පාසල් ප්‍රවාහන සේවා, ත්‍රිරෝද රථ සේවා සහ වෙනත් යම් අන්තර් පළාත් මාර්ගස්ථ ප්‍රවාහන සේවාවක් යොදාගෙන පළාත් අතර මාර්ගස්ථ ප්‍රවාහන සේවා සඳහා පහසුකම් සැලසීම;";

(3) එහි (ආ) ඡේදයේ "බස් රථ මගින් මගී ප්‍රවාහනයට" යන වචන වෙනුවට, "මාර්ගස්ථ ප්‍රවාහනයට" යන වචන ආදේශ කිරීමෙන්";

(4) එහි (ඇ) ඡේදයේ "එම සේවා සපයන්නන් අතර" යන වචන වෙනුවට, "සෑම ප්‍රවාහන මාධ්‍යයක ම" යන වචන ආදේශ කිරීමෙන්"; සහ

(5) එහි (ඉ) ඡේදය ඉවත් කර, ඒ වෙනුවට පහත ඡේද ආදේශ කිරීමෙන්:-

"(ඉ) ආරක්ෂාකාරී සහ සැප පහසු මාර්ගස්ථ ප්‍රවාහනයක් සහතික කිරීම; සහ

(ඊ) මාර්ගස්ථ ප්‍රවාහනය වැඩි දියුණු කිරීමට අදාළ ප්‍රමිතීන් සහ නිර්ණායක තීරණය කිරීම,".

ප්‍රධාන ප්‍රඥප්තියට 1අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 1 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රඥප්තියේ 1අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:-

"පනතේ පරමාර්ථ

1අ. (අ) පළාත් අතර බස් රථ සේවා සහ ප්‍රවාහන සේවා සඳහා පහසුකම් සැලසීම;

(ආ) බස් රථ සේවා සහ ප්‍රවාහන සේවා අධීක්ෂණය කිරීම සහ ප්‍රවාහන සේවා සපයන්නන් විසින් එම සේවාවන්ට අදාළ ප්‍රමිතීන් සපුරාලන බවට සහතික වීම; සහ

(ඇ) අදාළ ප්‍රවාහන සේවා සපයන්නන් විසින් සිදු කරනු ලැබිය හැකි වරදවල් සහ එකී වරදවල් සඳහා කොමිෂන් සභාව විසින් පැනවිය හැකි දණ්ඩන සම්බාධක නියම කිරීම,

පනතේ පරමාර්ථ විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) "බස් රථ මගින් මගී ප්‍රවාහන සේවාවන්ට අදාළ ජාතික ප්‍රතිපත්තිය පිළිබඳව ආණ්ඩුවට උපදෙස් දීම" යන වචන වෙනුවට, "මාර්ගස්ථ ප්‍රවාහනයට අදාළ ජාතික ප්‍රතිපත්ති පිළිබඳව ආණ්ඩුවට උපදෙස් දීම" යන වචන ආදේශ කිරීමෙන්";

(2) එහි (එ) ඡේදයේ "නිශ්චිත ප්‍රදේශයෙහි" යන වචන වෙනුවට, "නිශ්චිත ප්‍රදේශයෙහි සහ බස් රථ සේවා හැර අනෙක් ප්‍රවාහන සේවා සඳහා ප්‍රවාහන සේවා අවසර පත්‍ර නිකුත් කිරීම" යන වචන ආදේශ කිරීමෙන්;";

(3) එහි (ඔ) ඡේදය ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

"(ඔ) බස් රථ සේවා හා ප්‍රවාහන සේවා සැලසීම සඳහා සහ එහි මගී සේවා අවසර පත්‍ර සහ ප්‍රවාහන සේවා අවසර පත්‍ර නිකුත් කිරීම සඳහා යම් තැනැත්තකු සමඟ ගිවිසුම්වලට ඇතුළත් වීම;";

(4) එහි (ක) ඡේදය ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

"(ක) බස් රථ සේවා සහ ප්‍රවාහන සේවා මගින් පළාත් අතර භාණ්ඩ ප්‍රවාහනය කිරීම සඳහා කටයුතු පිළියෙල කිරීම;"; සහ

(5) එහි (ක) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේද එකතු කිරීමෙන්:-

"(ග) ජාතික මට්ටමෙන් මාර්ගස්ථ ප්‍රවාහන මාර්ගෝපදේශයක් සකස් කිරීම;

(ච) අදාළ පරදු දරන්නන්ගේ ලිඛිත සැල කිරීම් සලකා බැලීමෙන් පසු, ප්‍රවාහන ගාස්තු අය කිරීම සඳහා සූත්‍රයක් තීරණය කිරීම සහ මාර්ගස්ථ ප්‍රවාහනයට

අදාළ ජාතික ප්‍රතිපත්තිය, කලින් කලට, තක්සේරු කිරීම සහ අවශ්‍ය විට දී එම සූත්‍රය ප්‍රතිශෝධනය කිරීම;

(ජ) ප්‍රවාහන පද්ධතිය දියුණු කිරීම සඳහා නූතන තාක්ෂණික පද්ධති භාවිතය ප්‍රවර්ධනය කිරීම සහ නියාමනය කිරීම;

(ට) ප්‍රවාහන සේවාවන්ට අදාළ යටිතල පහසුකම් ප්‍රතිපාදන සැපයීම සඳහා පහසුකම් සැලසීම;

(ඩ) ප්‍රවාහන සේවා සඳහා ජාතික තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යාම සහ ප්‍රවාහන සේවා සපයන්නන් විසින් සලසනු ලබන සේවා අධීක්ෂණය කිරීම;

(ණ) ප්‍රවාහන සේවා සපයන්නන් පුහුණු කිරීමට පුහුණු මධ්‍යස්ථානයක් පිහිටුවීම;

(ත) මේ පනත යටතේ අවසර පත්‍රයක් නිකුත් කරනු ලැබ ඇත්තේ යම් තැනැත්තකු වෙත ද, අවසර පත්‍රයක් අලුත් කරනු ලැබ ඇත්තේ යම් තැනැත්තකුගේ ද එකී තැනැත්තා වෙත විධාන නිකුත් කිරීම;

(ද) පනතෙහි නිශ්චිතව දක්වා ඇති කොමිෂන් සභාවේ කටයුතු සඳහා සහාය වීමට උපකමිටු පත් කිරීම;

(න) මාර්ගස්ථ ප්‍රවාහනයට අදාළ ජාතික ප්‍රතිපත්තිය වාර්ෂිකව සමාලෝචනය කිරීම සහ එම ප්‍රතිපත්තියට අදාළ නීතිමය, පරිපාලනමය හෝ වෙනත් කරුණු සම්බන්ධයෙන් ආණ්ඩුවට උපදෙස් දීම;

(ප) අදාළ අමාත්‍යාංශ, පළාත් සභා, පළාත් පාලන ආයතන, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල,

රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සංවිධාන විමසීම සහ මාර්ග අනතුරු වැළැක්වීමේ කාර්යය සඳහා සහ මගීන්ගේ අයිතිවාසිකම් සුරැකීම සහ ආරක්ෂා කිරීම සඳහා ප්‍රවාහන සේවා දියුණු කිරීම සඳහා අවශ්‍ය කරනු ලැබිය හැකි පියවර නිර්දේශ කිරීම;

(ඛ) මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් කඩ කිරීම සම්බන්ධයෙන් මහජනතාවගෙන් පැමිණිලි ලබා ගැනීම; සහ

(ම) අවසර පත්‍රයක් හෝ සහතිකයක් ඉල්ලුම් කරන ඉල්ලුම්කරුවකුගේ, මගියකුගේ හෝ අවසර පත්‍රයක් හෝ සහතිකයක් දරන්නකුගේ පහසුව සඳහා හෝ පනතේ කාර්යක්ෂම පරිපාලනය සඳහා අවශ්‍ය කරනු ලැබිය හැකි, 44 වන වගන්තිය යටතේ නියෝග සාදන ලද කරුණු සඳහා පුළුල් ප්‍රචාරයක් ලබා දීම.".

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය, එහි (ඌ) ඡේදය ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම

"(ඌ) බස් රථ සේවා සහ ප්‍රවාහන සේවා සැලසීමට අදාළ ස්වකීය කර්තව්‍ය නිසි පරිදි සිදු කළ හැකි වනු පිණිස මගී සේවා අවසර පත්‍ර සහ ප්‍රවාහන සේවා අවසර පත්‍ර දරන්නන්ට ඉංජිනේරු, තාක්ෂණික, නීතිමය, වෛද්‍ය සහ මූල්‍ය ආධාර සහ උපදෙස් ලබා දීම; සහ".

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය, එහි "මගී සේවා අවසර පත්‍රයක් දරන්නකුට" යන වචන වෙනුවට, "අවස්ථාවෝචිත පරිදි, මගී සේවා අවසර පත්‍රයක් දරන්නකුට හෝ ප්‍රවාහන සේවා අවසර පත්‍රයක් දරන්නකුට" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම

ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කිරීම

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (1) වන උපවගන්තියේ "දින දහහතරක් ඇතුළත," යන වචන වෙනුවට, "දින තිහක් ඇතුළත," යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) එම වගන්තියේ පැති සටහන ඉවත් කොට, ඒ වෙනුවට, පහත දැක්වෙන පැති සටහන ආදේශ කිරීමෙන්:-

"බලයලත් තැනැත්තකුගේ යම් තීරණයකට විරුද්ධව වන අභියාචන".

ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය, එහි (2) වන උපවගන්තියේ "දින දහහතරක්" යන වචන වෙනුවට, "දින තිහක්" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය මෙයින් ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීම සඳහා නිර්ණායක

**24.** (1) මගී සේවා අවසර පත්‍රයක් ලබා ගැනීම සඳහා ඉල්ලුම් පත්‍රයක් ලැබුණු විට, කොමිෂන් සභාව විසින් මගී සේවා අවසර පත්‍ර ප්‍රදානය කරනු ලැබීමට හෝ ප්‍රතික්ෂේප කරනු ලැබීමට පෙර පහත දැක්වෙන නිර්ණායක සැලකිල්ලට ගත යුතු ය:-

(අ) ඉල්ලුම් පත්‍රයෙහි අයැද ඇති මාර්ගයේ හෝ මාර්ගවල බස් රථ සේවා සඳහා වන මහජනතා ඉල්ලුම;

(ආ) යෝග්‍ය විය හැකි නියම හා කොන්දේසිවලට යටත්ව, කාර්යක්ෂම සේවාවක් සැපයීම සඳහා ඉල්ලුම්කරු සතු හැකියාව;

(ඈ) පවරනු ලැබිය හැකි මාර්ගයක හෝ මාර්ගවල ගමන් භාර ගැනීම සඳහා බස් රථවල යෝග්‍යතාවය;

(ඈ) පනතේ සහ නියෝගවල සහ වෙනත් ලිඛිත නීතියක විධිවිධාන සලසා ඇති ආකාරයට බස් රථය පවත්වාගෙන යාම සඳහා පෙරාතුව ම වූ මාස හයක් ආවරණය වන බැංකු ප්‍රකාශයක් මත පදනම්ව ඉල්ලුම්කරුගේ අඛණ්ඩ මූල්‍ය ශක්‍යතාව; සහ

(ඉ) භාණ්ඩ හෝ ගමන්මලු සඳහා වෙන් කර ඇති ඉඩකඩ ද ඇතුළුව රියදුරුට, කොන්දොස්තරවරයාට සහ මගීන්ට සලසා ඇති පහසුකම්වල යෝග්‍යතාව.".

**ප්‍රධාන ප්‍රඥප්තියට 24අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම**

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 24අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:-

"තාවකාලික අවසර පත්‍රයක් නිකුත් කිරීම

24අ. (1) කොමිෂන් සභාව විසින්, 18 වන වගන්තියට යටත්ව, උත්සව සමයක හෝ නිවාඩු දිනයක සහ වෙනත් සමාජ අවශ්‍යතා සැලකිල්ලට ගෙන, සැබෑ මගී ඉල්ලුම සහ අවශ්‍යතාව සපුරාලීම පිණිස 24 වන වගන්තියට අනුකූලව තීරණය කරනු ලැබිය හැකි වෙනත් යම් මාර්ගයක හෝ මාර්ගවල සහ යම් කාලසීමාවක් සඳහා බස් රථය ධාවනය කිරීමට බලය ලබා දීමට තාවකාලික අවසර පත්‍රයක් නිකුත් කරනු ලැබිය හැකි ය.".

**ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම**

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය එහි (ඇ) ඡේදයේ "සියලු අවස්ථාවන්හි දී සුදුසු හා සේවය කළ හැකි තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු බවට" යන වචන වෙනුවට, "මහජනයාගේ ආරක්ෂාව සහ පහසුව සුරක්ෂිත කිරීම සඳහා කොමිෂන් සභාවේ නිර්දේශ සමඟ නියම කරනු ලැබිය හැකි අවම ප්‍රමිතීන්ට අනුකූලව

පවත්වාගෙන යා යුතු බවට" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"අවසර පත්‍රය පැවරීම

28. (1) වලංගු මගී සේවා අවසර පත්‍රයක් දරන්නකු, කොමිෂන් සභාවේ පූර්ව අනුමතය සහිතව, එකී අවසර පත්‍රයේ නිශ්චිතව දක්වා ඇති ඉතිරි කාලසීමාව සඳහා එකී අවසර පත්‍රය පැවරීම සිදු කළ හැකි ය. පවරනු ලබන්නේ යම් තැනැත්තකු වෙත ද, එකී තැනැත්තා විසින්, බස් රථයේ සන්තකය ලැබීමෙන් සතියක් ඇතුළත, අවසර පත්‍රය කල් ඉකුත් වුව ද කල් ඉකුත් නොවූව ද, නියම කරනු ලැබිය හැකි ආකෘතියෙන් සහ ආකාරයෙන් සහ නියමිත ගාස්තු ගෙවීමෙන් පසු, කොමිෂන් සභාවට ඉල්ලුම්පතක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාව විසින්, මගී සේවා අවසර පත්‍රයක් ප්‍රදානය කිරීමට හෝ ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කිරීමට පෙරාතුව, 18 වන වගන්තියට යටත්ව සහ 24 වන වගන්තිය යටතේ විධිවිධාන සලස්වා ඇති කාර්යපටිපාටිය සහ නියම හා කොන්දේසිවලට හෝ එහි නියම කර ඇති නිශ්චිත නිර්ණායකවලට යටත්ව, එම ප්‍රදානය හෝ ප්‍රතික්ෂේප කිරීම සලකා බැලිය යුතු ය.

(3) මේ වගන්තියේ විධිවිධානවලට හෝ ඒ යටතේ සාදනු ලබන යම් නියෝගයකට අනුකූල වීමට අපොහොසත් වන යම් තැනැත්තකු 40 වන වගන්තිය යටතේ වරදකට වරදකරු විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය සංශෝධනය කිරීම

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (1) වන උපවගන්තියේ "ඒ අවසර පත්‍රයේ කාලය ඉකුත් වන දිනයේ සිට ගණන් බලනු ලබන එක් අවුරුද්දකට නොඅඩු හා අවුරුදු තුනකට නොවැඩි කාලයක් සඳහා" යන වචන වෙනුවට, "24 වන, 25(1) වන සහ 31(1) වන වගන්ති යටතේ වන විධිවිධානවලට යටත්ව සහ අවසර පත්‍රය දරන්නාගේ කාර්යසාධනය පිළිබඳ සලකා බලමින්, ඒ අවසර පත්‍රයේ කාලය ඉකුත් වන දිනයේ සිට ගණන් බලනු ලබන එක් අවුරුද්දකට නොඅඩු හා අවුරුදු තුනකට නොවැඩි කාලයක් සඳහා" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

"(1අ) මගී සේවා අවසර පත්‍රයක් අලුත් කිරීම සඳහා වන ඉල්ලුම් පත්‍රයක්, අවසර පත්‍රයේ කාලය ඉකුත් වන දිනයට මාස හයකට පෙර ඉදිරිපත් කළ යුතු ය.";

(3) එහි (2) වන උපවගන්තියේ -

(අ) (ඇ) ඡේදයේ "අවසර පත්‍රය අලුත් කිරීම සඳහා නියමිත ගාස්තුව ගෙවා නොමැති බව," යන වචන වෙනුවට, "අවසර පත්‍රය අලුත් කිරීම සඳහා නියමිත ගාස්තුව ගෙවා නොමැති බව;" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(ඈ) කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන සහ නියෝග මගින් නියම කරනු ලබන කාර්යසාධන නිර්ණායක අනුව සතුටුදායක ලෙස ක්‍රියා කර නොමැති බව.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය සංශෝධනය කිරීම

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (1) වන උපවගන්තියේ "දින දහහතරක්" යන වචන වෙනුවට, "දින තිහක්" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) එම වගන්තියේ පැති සටහන ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන පැති සටහන ආදේශ කිරීමෙන්:-

"කොමිෂන් සභාවේ යම් තීරණයකට විරුද්ධව වන අභියාචන".

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් කොටස (34අ සිට 34ඈ දක්වා වන වගන්ති) මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා ඒ ප්‍රඥප්තියේ IIඅ වන කොටස ලෙස බලාත්මක විය යුතු ය:- ප්‍රධාන ප්‍රඥප්තියේ IIඅ අලුත් කොටස ඇතුළත් කිරීම

"IIඅ වන කොටස

**අන්තර් පළාත් බස් රථ සේවා හැර පළාත් අතර ක්‍රියාත්මක වන ප්‍රවාහන සේවා නියාමනය**

ප්‍රවාහන සේවා ප්‍රකාශයට පත් කිරීම සහ ලියාපදිංචිය

34අ. (1) බස් රථ සේවාවන්ට අදාළ වන II වන කොටස ක්‍රියාත්මක වීම නොතකා, අමාත්‍යවරයා විසින්, කොමිෂන් සභාවේ නිර්දේශය මත, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමය මගින් පළාත් අතර ක්‍රියාත්මක කරනු ලැබිය හැකි කාර්යාල ප්‍රවාහන සේවා, පාසල් ප්‍රවාහන සේවා සහ ත්‍රීරෝද රථ සේවා, නම් කරන ලද ප්‍රවාහන සේවා ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි ය. අමාත්‍යවරයා විසින්, මේ කොටසේ කාර්ය සඳහා සේවා මාධ්‍යයක් ලෙස පළාත් අතර ක්‍රියාත්මක විය යුතු අවශ්‍ය විය හැකි යම් වෙනත් ප්‍රවාහන මාධ්‍ය ප්‍රකාශයට පත් කිරීම සඳහා කලින් කලට, යම් නියමයක් වෙනස් කිරීම, සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(2) (අ) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියමයක් ම, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දින හෝ නියමයේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි පසු දිනයක හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(ආ) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියමයක් ම, ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් මාස තුනක් ඇතුළත අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු අතර, එසේ අනුමත නොකරනු ලබන යම් නියමයක්, ඒ අනනුමතයේ දින සිට, එහෙත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට අගතියක් නොමැතිව පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(ඇ) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න වූ ලෙස සලකනු ලබන දිනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

(3) (අ) සෑම ප්‍රවාහන සේවා සපයන්නකු ම කොමිෂන් සභාවෙහි ලියාපදිංචි කරනු ලැබිය යුතු අතර, කොමිෂන් සභාව විසින්, එකී සේවා සපයන්නා වෙත (මෙහි මින් මතු "ප්‍රවාහන සේවා අවසර පත්‍රය" ලෙස සඳහන් කරනු ලබන) අවසර පත්‍රයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(ආ) කොමිෂන් සභාව විසින් එක් එක් ප්‍රවාහන සේවය සඳහා නාමලේඛනයක් පවත්වාගෙන යා යුතු අතර, කොමිෂන් සභාව විසින් කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියේ අදාළ ලියාපදිංචි විස්තර ඇතුළත් කරමින් දත්ත පද්ධතිය සමගාමීව යාවත්කාලීන කළ යුතු ය. ලියාපදිංචි ප්‍රවාහන සේවා සපයන්නන් පිළිබඳ විස්තර කොමිෂන් සභාව විසින්, කලින් කලට, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින් ප්‍රකාශයට පත් කළ යුතු ය.

(ඇ) ලියාපදිංචි කිරීම සඳහා වන කාර්යපටිපාටිය සහ ප්‍රවාහන සේවා අවසර පත්‍රය නිකුත් කරන ආකාරය නියම කරනු ලබන පරිදි විය යුතු ය.

(4) යම් ප්‍රවාහන සේවා සපයන්නකු, මේ වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ ලියාපදිංචි වී

ඇත්නම් මිස, (1) වන උපවගන්තියේ දක්වා ඇති පරිදි ප්‍රවාහන සේවා සැපයීම නොකළ යුතු ය.

(5) අදාළ ප්‍රවාහන සේවාවේ නියම හා කොන්දේසිවලට සහ කලින් කලට නියම කරනු ලැබිය හැකි, එකී අවසර පත්‍ර දරන්නා විසින් පවත්වාගෙන යනු ලැබිය යුතු එකී සේවාවේ ප්‍රමිතීන්ට යටත්ව, අවස්ථාවෝචිත පරිදි, ප්‍රවාහන සේවා අවසර පත්‍රය නිකුත් කිරීම හෝ නිකුත් නොකිරීම කළ යුතු ය.

(6) (අ) ප්‍රවාහන සේවා අවසර පත්‍රය වෙනස් කරනු ලබන;

(ආ) ව්‍යාජ ලේඛන ඉදිරිපත් කරනු ලබන; හෝ

(ඇ) (3) වන උපවගන්තිය යටතේ ලියාපදිංචි නොකරන ලද වාහනයක් මගින් යම් ප්‍රවාහන සේවාවක් සපයනු ලබන,

යම් ප්‍රවාහන සේවා සපයන්නකු මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, වරද සඳහා වන දණ්ඩනය සම්පූර්ණයෙන් අවසන් වන තෙක් සහ මේ වගන්තියේ දක්වා ඇති ආකාරයට ප්‍රවාහන සේවා සපයන්නා ලියාපදිංචි කරනු ලබන තෙක්, මහජනතාව දැනුම්වත් කිරීම සඳහා වරදකරු කරනු ලැබීමෙන් පසු එවැනි තැනැත්තන්ගේ නම් සහ විස්තර කොමිෂන් සභාව විසින් නිල වෙබ් අඩවියේ පළ කළ යුතු ය.

ප්‍රවාහන සේවා වර්ග කිරීම සහ සහතිකයක් නිකුත් කිරීම

34ආ. (1) අමාත්‍යවරයා විසින්, කොමිෂන් සභාවේ උපදෙස් මත, ප්‍රවාහන සේවා පන්ති වර්ග කිරීම සහ එකී යම් සේවාවක් මගින් පවත්වාගෙන යනු ලැබිය යුතු ප්‍රමිතීන් කලින් කලට නියම කිරීම කළ හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් ප්‍රවාහන සේවා පන්ති වර්ගීකරණය කර ඇති අවස්ථාවක, කොමිෂන් සභාව විසින් එම වර්ගීකරණය අනුව ප්‍රවාහන සේවා අවසර පත්‍රය දරන්නාට සහතිකයක් නිකුත් කළ යුතු ය.

සහතික පත්‍රය වින්ඩ්ස්ක්‍රීනයේ ප්‍රදර්ශනය කළ යුතු බව

34ඇ. (1) ප්‍රවාහන සේවා අවසර පත්‍රය දරන්නා විසින් සහතික පත්‍රය, ඒ සහතිකය අදාළ වන ප්‍රවාහන රථයට ඇතුළු වන යම් තැනැත්තකුට පැහැදිලිව පෙනෙන ආකාරයෙන් ඒ රථයේ වින්ඩ්ස්ක්‍රීනයේ ප්‍රදර්ශනය කිරීමට සැලැස්විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානයන්ට අනුකූල වීමට අපොහොසත් වන හෝ තෙවන පාර්ශ්වයක් නොමඟ යවන හෝ ව්‍යාකූල වන පරිදි සහතිකයට ඉතා ආසන්න නියෝජනයක් ප්‍රදර්ශනය කරන යම් තැනැත්තකු, මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

පනතේ IIඅ වන කොටස යටතේ වන අභියාචන

34ඈ. මේ පනතේ IIඅ වන කොටස යටතේ කොමිෂන් සභාවේ තීරණයක් මගින් අගතියට පත් යම් තැනැත්තකු විසින්, එකී තීරණය එම අගතියට පත් තැනැත්තා වෙත සැල කරනු ලබන දින සිට දින තිහක් ඇතුළත අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත එම තීරණයට විරුද්ධව අභියාචනා කළ හැකි ය.

(2) මේ පනතේ 33 වන වගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, (1) වන උපවගන්තිය යටතේ වන යම් අභියාචනයකට අදාළ විය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තිය සංශෝධනය කිරීම

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තියේ (2) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (ආ) ඡේදයේ "මුදල්" යන වචනය වෙනුවට, "මුදල්;" යන වචනය ආදේශ කිරීමෙන්; සහ

(2) එහි (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:-

"(ඇ) අධිකරණයක් මගින් හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ හෝ මහෙස්ත්‍රාත්වරයකු විසින් ඔහුගේ අභිමතය පරිදි එයට ගෙවීමට විධාන කරනු ලබන සියලු මුදල්,".

ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය සංශෝධනය කිරීම

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තියේ "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන" යන වචන සහ ඉලක්කම් වෙනුවට, "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියට 38අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 38අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:-

"ගාස්තු ගණනය කිරීම

38අ. (1) පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද සහ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයක් මගින් නිශ්චිතව දක්වා ඇති ප්‍රවාහන ගාස්තුවලට අදාළ ජාතික ප්‍රතිපත්තියට අනුකූලව, කලින් කලට, කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන සූත්‍රයට අනුව, බස් රථ සේවා ඇතුළු ප්‍රවාහන සේවාවන්ට අදාළ ප්‍රවාහන සේවා ගාස්තු කොමිෂන් සභාව විසින් ගණනය කරනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාව විසින්, අදාළ ප්‍රවාහන සේවාවන්ට අදාළ වන ප්‍රවාහන සේවා ගාස්තුවල ලැයිස්තු කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියේ පළ කරනු ලැබිය යුතු අතර, එක් එක් ප්‍රවාහන සේවා සපයන්නා විසින් එකී වෙබ් අඩවියේ පළ

කරන ලද එකී ලැයිස්තුවලට අනුව ස්වකීය සේවයට අදාළ වන ප්‍රවාහන සේවා ගාස්තුවල ලැයිස්තුවක් සකස් කරනු ලැබිය යුතු අතර, එය ප්‍රවාහන රථයේ පැහැදිලිව පෙනෙන යම් ස්ථානයක ප්‍රදර්ශනය කිරීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) කොමිෂන් සභාව විසින්, 39 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධානයන්ට අනුකූලව, කලින් කලට, ප්‍රවාහන සේවා සපයන්නන් විසින් මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවලට අනුකූලව කටයුතු කරන්නේ ද යන වග පරීක්ෂා කරනු ලැබිය හැකි අතර, මේ වගන්තියේ විධිවිධානවලට අනුකූල වීමට අපොහොසත් වන යම් තැනැත්තකු 40 වන වගන්තිය යටතේ වරදකට වරදකරු වන්නේ ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියට 38ආ, 38ඇ සහ 38ඈ අලුත් වගන්ති ඇතුළත් කිරීම

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ “IV වන කොටස සාමාන්‍ය විධිවිධාන” යන ශීර්ෂයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එම වගන්ති ප්‍රධාන ප්‍රඥප්තියේ 38ආ, 38ඇ සහ 38ඈ වගන්ති ලෙස බලාත්මක විය යුතු ය:-

“කොමිෂන් සභාව විසින් බස් රථ සේවා සහ ප්‍රවාහන සේවා අධීක්ෂණය කළ යුතු බව

38ආ. (1) කොමිෂන් සභාව විසින් -

(අ) අදාළ රජයේ ආයතනවල සහාය ඇතිව ආරක්ෂිත, කාර්යක්ෂම සහ ඵලදායී අන්තර් පළාත් ප්‍රවාහනයක් සහතික කිරීම සඳහා සහ අධීක්ෂණ කටයුතු සම්බන්ධයෙන් සහ සේවා සපයන්නන් විසින් ගනු ලබන යම් ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් වන වාර්තා එකී රජයේ ආයතනවලින් කැඳවිය හැකි ය; සහ

(ආ) ප්‍රවාහන රථවලින් ඇති වන ශබ්ද දූෂණයේ සහ වෙනත් විමෝචනයන්හි බලපෑම මධ්‍යම පරිසර අධිකාරියේ

සහාය ඇතිව තක්සේරු කිරීමට සහ 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ නිශ්චිතව දක්වා ඇති ප්‍රමිතීන්ට අනුකූල වීම සඳහා සහාය වීමට,

බස් රථ සේවා සහ ප්‍රවාහන සේවා අධීක්ෂණය කළ යුතු ය.

(2) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ නිශ්චිතව දක්වා ඇති ප්‍රමිතීන්ට අනුකූලව ප්‍රවාහන රථය පවත්වාගෙන යාමට අපොහොසත් වන සෑම අවසර පත්‍ර දරන්නකු ම මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් අනතුරුව වරදකරු කරනු ලැබීමේ දී රුපියල් ලක්ෂ පහකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් අධීක්ෂණය කරන ආකාරය නියම කර ඇති පරිදි විය යුතු ය.

පුහුණු මධ්‍යස්ථානයක් පිහිටුවීම

38ඈ. (1) කොමිෂන් සභාව යටතේ ප්‍රවාහන සේවා නගා සිටුවීම සඳහා පුහුණු මධ්‍යස්ථානයක් පිහිටුවිය යුතු ය. යාන්ත්‍රික කුසලතා, මාර්ග ආරක්ෂණ හදිසි පියවර සහ මාර්ග සුචාරිත්‍ර විධි පිළිබඳ පුහුණු අවස්ථා ලබා දීමෙන් ප්‍රවාහන සේවා සපයන්නන්ගේ සමස්ත ශක්‍යතාව ඉහළ නැංවීම මධ්‍යස්ථානයේ කාර්යය විය යුතු ය.

(2) නියම කර ඇති පරිදි සටහන් පවත්වාගෙන යාම, වාර්තා කිරීම, මූල්‍ය වගවීම සහ අධීක්ෂණය කිරීම ඇතුළු මධ්‍යස්ථානයේ කළමනාකරණය කොමිෂන් සභාව විසින් භාරගත යුතු ය.

ආචාර ධර්ම සංග්‍රහ නියම කිරීමට අමාත්‍යවරයා සතු බලතල

38ඈ. (1) අන්තර් පළාත් බස් රථ සේවා සහ 34අ වගන්තියේ (1) වන උපවගන්තියේ සලසා ඇති ප්‍රවාහන සේවා සියල්ලම හෝ කිසිවක් සම්බන්ධයෙන් අදාළ විය යුතු ආචාර ධර්ම සංග්‍රහ අමාත්‍යවරයා විසින් නියම කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වන නියෝග කොමිෂන් සභාවේ උපදෙස් මත සහ පාර්ලිමේන්තුවේ අනුමතය ලබා ගැනීමෙන් පසුව පමණක් සාදනු ලැබිය යුතු ය.

(3) (අ) යම් ප්‍රවාහන සේවා සපයන්නකු විසින්, (1) වන උපවගන්තිය ප්‍රකාරව නියම කරනු ලබන යම් ආචාර ධර්ම සංග්‍රහයක දක්වා ඇති යම් කරුණක් උල්ලංඝනය කර ඇති හෝ යම් කරුණකට අනුකූලවීමට අපොහොසත් වන හෝ එකී උල්ලංඝනය කිරීම හෝ අනනුකූල වීම සඳහා සාධාරණ සම්භාවිතාවක් හෝ ඇති අවස්ථාවක, කොමිෂන් සභාව විසින්, නියම කරනු ලැබිය හැකි කාර්යපටිපාටියට අනුකූලව පරීක්ෂණයක් පැවැත්විය හැකි ය.

(ආ) අදාළ ප්‍රවාහන සේවා සපයන්නාට (අ) ඡේදය යටතේ වන පරීක්ෂණයේ දී කරුණු දැක්වීමට අවස්ථාවක් ලබා දීමෙන් පසු, කොමිෂන් සභාව විසින්-

(i) අදාළ ආචාර ධර්ම සංග්‍රහයට අදාළ යම් ක්‍රියාවක් සිදු කිරීම හෝ ක්‍රියාවක් නොකර හැරීම නතර කිරීමට සහ ඉන් වැළකීමට;

(ii) කොමිෂන් සභාවේ මතය අනුව එම අවස්ථාව නිවැරදි කිරීමට අවශ්‍ය වන යම් ක්‍රියා සිදු කිරීමට; හෝ

(iii) (අ) ඡේදය යටතේ ප්‍රවාහන සේවා සැපයුම්කරුවකු විසින් කරන ලද යම් උල්ලංඝනය කිරීමක ප්‍රතිඵලයක් ලෙස උපද්‍රවයක්, පාඩුවක් හෝ හානියක් අත්විඳ ඇති පීඩාවට පත් තැනැත්තකු වෙත කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන යම් මුදලක් වන්දියක් වශයෙන් ගෙවීමට,

එම ප්‍රවාහන සේවා සපයන්නා වෙත නියම කරනු ලැබිය හැකි යම් කාලයක් ඇතුළත විධානයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(ඇ) (ආ) ඡේදය යටතේ නිකුත් කරනු ලබන සෑම විධානයක් ම ලිඛිතව සිදු කරනු ලැබිය යුතු අතර, විධානයට ලක්වන්නා වූ ප්‍රවාහන සේවා සපයන්නා වෙත ලියාපදිංචි තැපෑලෙන්, ඉලෙක්ට්‍රොනික සන්නිවේදනයෙන් හෝ කොමිෂන් සභාව තීරණය කරනු ලබන වෙනත් සමාන මාධ්‍යයන්ගෙන් විධානය දැනුම් දෙනු ලැබිය යුතු ය. තව ද, එම ප්‍රවාහන සේවා සපයන්නා එම දැනුම් දෙනු ලබන දින සිට එම විධානයට අවනත විය යුතු අතර, එම විධානය මගින් බැඳී සිටිය යුතු ය.”.

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

“අවසර පත්‍ර දරන්නන්ට විධාන නිකුත් කිරීමට කොමිෂන් සභාව සතු බලය

39. (1) මේ පනත යටතේ අවසර පත්‍රයක් නිකුත් කරනු ලැබුවේ යම් තැනැත්තකුට ද නැතහොත් එවැනි අවසර පත්‍රයක් අලුත් කරනු ලැබුවේ යම් තැනැත්තකුගේ ද, ඒ තැනැත්තා වෙත, මේ පනතේ විධිවිධානවලට හෝ ඒ යටතේ සාදන ලද නියෝගවලට හෝ ඒ අවසර පත්‍රයට සම්බන්ධ යම්

කොන්දේසියකට හෝ අනුකූලව ඒ තැනැත්තා විසින් ක්‍රියා කරනු ලැබීමට සැලැස්වීමේ කාර්යය සඳහා අවශ්‍ය යයි කොමිෂන් සභාව විසින් සලකනු ලබන සාමාන්‍ය හෝ විශේෂ විධාන, කොමිෂන් සභාව විසින් නිකුත් කළ හැකි අතර, ඒ විධානවල නිශ්චිතව දක්වනු ලැබිය යුතු කාලය ඇතුළත ඒ විධානවලට අනුකූල වීම, එකී විධාන නිකුත් කරනු ලැබුවේ යම් තැනැත්තකු වෙත ද, ඒ තැනැත්තාගේ කාර්යය විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කර්ය සඳහා, කොමිෂන් සභාව විසින් ලිඛිතව බලය දෙන ලද යම් තැනැත්තකු විසින් කවර හෝ වේලාවක -

(අ) යම් ප්‍රවාහන රථයක් භාවිත කරනු ලබන්නේ, අදාළ විය හැකි පරිදි, අවසර පත්‍රයෙන් හෝ අලුත් කරන ලද අවසර පත්‍රයෙන් බලය ලබා දී ඇති කාර්ය සඳහා ද යන වග හෝ එහි නිශ්චිතව දක්වා ඇති යම් කොන්දේසි නැතහොත් යම් ආචාර ධර්ම සංග්‍රහයක් යටතේ නිකුත් කරන ලද යම් විධාන හෝ මේ පනතේ විධිවිධාන අනුව ක්‍රියා කරනු ලැබ නොමැත්තේ ද යන වග නිසැකවම දැනගැනීමට සඳහා එම රථයට ඇතුළු විය හැකි ය;

(ආ) අවස්ථාවෝචිත පරිදි, 34 වන වගන්තිය හෝ 34ආ වගන්තිය යටතේ නිකුත් කරන ලද සහතිකය හෝ එකී රථය සම්බන්ධයෙන් ප්‍රදානය කරන ලද වෙනත් යම් ලේඛනයක් හෝ ඉදිරිපත් කරන ලෙස එම රථයේ රියදුරුට නියම කළ හැකි ය; හෝ

(ඇ) ඒ සහතිකය, වෙනත් ලේඛනය හෝ එහි පිටපතක් ස්වකීය භාරයට ගත හැකි ය.

(3) (2) වන උපවගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් බලය දෙන ලද යම් නිලධරයකුගේ යම් විධානයකින්, නියමයකින් හෝ තීරණයකින් අගතියට පත් යම් තැනැත්තකු විසින්, එම විධානය, නියමය හෝ තීරණය එකී අගතියට පත් තැනැත්තා වෙත දැනුම් දෙනු ලබන දින සිට දින තිහක් ඇතුළත අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(4) මේ පනතේ 33 වන වගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, (3) වන උපවගන්තිය යටතේ වන යම් අභියාචනයකට අදාළ විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියට 39අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම

**22.** ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 39අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:-

"දණ්ඩන පැනවීම

39අ. (1) යම් ප්‍රවාහන සේවා සපයන්නකු විසින් 38ඇ වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූල වීමට අපොහොසත් වන අවස්ථාවක, මගීන් වෙත එල්ලවන බලපෑම සහ අදාළ අනනුකූලතාවන් හි ස්වභාවය සහ ප්‍රමාණය සලකා බැලීමෙන් පසු, කොමිෂන් සභාව විසින්, පැනවිය යුතු දණ්ඩනය, එකී පැනවීමට තුඩුදුන් හේතු නිශ්චිතව දක්වමින් අදාළ ප්‍රවාහන සේවා සපයන්නා දැනුම්වත් කිරීම සඳහා දැන්වීමක් නිකුත් කළ යුතු ය. කොමිෂන් සභාව විසින් දැන්වීම ලැබුණු දින සිට දින විසි එකක කාලසීමාවක් ඇතුළත පුද්ගලිකව ම හෝ ලිඛිතව කරුණු ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාවක් එකී සේවා සපයන්නා වෙත ලබා දිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති කාලය ඉකුත් වීමේ දී, කොමිෂන් සභාව විසින් තීරණයක් ගෙන, එය කොමිෂන් සභාවේ අත්සන යටතේ සහතික පත්‍රයක් නිකුත් කිරීමෙන් ප්‍රවාහන සේවා සපයන්නා වෙත සැල කළ යුතු ය.

එම සහතිකයෙහි, අවස්ථාවෝචිත පරිදි, එක් එක් අනනුකූලතාවක් සඳහා රුපියල් ලක්ෂයක මුදලක් නොඉක්මවන්නා වූ දණ්ඩනයක් නිශ්චිතව දැක්විය හැකි ය, නැතහොත් එම දණ්ඩනයෙන් එකී සේවා සපයන්නා නිදහස් කළ හැකි ය.

(3) පෙර අවස්ථාවක දී දණ්ඩනයකට යටත් කරන ලද යම් ප්‍රවාහන සේවා සපයන්නකු විසින්, 38ඈ වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන යටතේ නිකුත් කරන ලද විධානයකට අනුකූල වීමට අපොහොසත් වන අවස්ථාවක, එකී තැනැත්තා (2) වන උපවගන්තිය යටතේ පනවනු ලැබිය හැකි දණ්ඩනයට අමතරව, දෙවන සහ ඊට පසුව වූ අනනුකූලතා අවස්ථාවක් සඳහා දණ්ඩනයක් ලෙස පනවන ලද මුදල මෙන් දෙගුණයක ප්‍රමාණය ඇතුළත් වන අමතර දණ්ඩන මුදලක් ගෙවීමට යටත් විය යුතු ය.

(4) කොමිෂන් සභාව විසින්, මේ වගන්තිය යටතේ පනවන ලද දණ්ඩනයක් එකතු කිරීම සඳහා වගකිව යුතු අතර, එසේ එකතු කරන ලද මුදල්, 38ඈ වගන්තියේ (3) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (iii) වන අනුඡේදයේ විධිවිධානවලට අනුකූල නොවීම හේතුවෙන් බලපෑමට ලක් වූ අගතියට පත් තැනැත්තා වෙත ගෙවිය යුතු යම් වන්දි මුදලක් ඇත්නම්, එකී වන්දි මුදල ලෙස එකතු කළ මුදල අඩු කිරීමෙන් පසු කොමිෂන් සභාවේ අරමුදලට බැර කළ යුතු ය.

(5) (අ) (1) වන හෝ (2) වන උපවගන්තිය ප්‍රකාරව දණ්ඩනයකට යටත් වන යම් ප්‍රවාහන සේවා සපයන්නකු, එකී දැන්වීමේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් කාලසීමාව ඇතුළත එම දණ්ඩනය ගෙවීමට අපොහොසත් වන්නේ නම්, ස්වකීය සාමාන්‍ය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී කොළඹ මහෙස්ත්‍රාත් අධිකරණය විසින් පැනවිය හැකි දඩ මුදල ඉක්ම වුව ද, එම අධිකරණය විසින් පනවන

ලද දඩයක ආකාරයෙන් ආපසු අය කර ගනු ලැබිය යුතු දණ්ඩනය ගෙවීමට නියම කරන්නා වූ ආඥාවක් නිකුත් කිරීමට, කොමිෂන් සභාව විසින් ඒකපාර්ශ්වික ඉල්ලීමක් එකී අධිකරණයට කරනු ලැබිය හැකි ය.

(ආ) යම් ප්‍රවාහන සේවා සපයන්නකු ලිත් මාස හයක කාලසීමාවක් ඇතුළත අවස්ථා තුනක දී හෝ ඊට වැඩි අවස්ථා ගණනක දී දණ්ඩනයකට යටත් බවට පත් වන්නේ නම්, මේ පනත යටතේ නිකුත් කරන ලද හෝ අලුත් කරන ලද ඔහුගේ අවසර පත්‍රය මාස තුනක් නොඉක්මවන කාලයක් සඳහා අත්හිටුවීමට මහෙස්ත්‍රාත්වරයා විසින් ආඥා කරනු ලැබිය හැකි ය.

(6) මේ පනත යටතේ දණ්ඩනයක් පැනවීම මගින්, අදාළ පාලක හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක් විසින්, එම ප්‍රවාහන සේවා සපයන්නා විසින් අදාළ ප්‍රවාහන සේවය කරගෙන යාම අත්හිටුවීම හෝ එම සේවය කරගෙන යාම සඳහා ප්‍රදානය කරන ලද බලපත්‍රය අවලංගු කිරීම ඇතුළත් වන, නමුත් ඒවාට සීමා නොවන වෙනත් යම් පාලක පියවර ගැනීමෙන් ඉවත් කරනු නොලැබිය යුතු ය.

(7) (අ) මේ වගන්තිය යටතේ පරිපාලනමය දණ්ඩනයක් පැනවීමෙන් අගතියට පත් යම් ප්‍රවාහන සේවා සපයන්නකු විසින්, එකී අගතියට පත් තැනැත්තා වෙත එම පරිපාලනමය දණ්ඩනය පිළිබඳ දැනුම් දෙනු ලබන දින සිට දින තිහක් ඇතුළත අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(ආ) මේ පනතේ 33 වන වගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, (අ) ඡේදය යටතේ වන යම් අභියාචනයකට අදාළ විය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තිය සංශෝධනය කිරීම

**23.** ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තිය, එහි "රුපියල් දෙලක්ෂයකට නොවැඩි දඩයකට" යන වචනවල සිට ඒ වගන්තිය අවසානය දක්වා සියලු වචන ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"රුපියල් දෙලක්ෂ පනස්දහසකට නොඅඩු සහ රුපියල් ලක්ෂ පහකට නොවැඩි දඩයකට හෝ වසර පහක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට එකී තැනැත්තා යටත් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තිය සංශෝධනය කිරීම

**24.** ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (ඊ) ඡේදයේ "ඉදිරිපත් කිරීම.'' යන වචන වෙනුවට, "ඉදිරිපත් කිරීම;" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) එහි (ඊ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් ඡේද එකතු කිරීමෙන්:-

"(උ) ප්‍රවාහන සේවා ලියාපදිංචිය;

(ඌ) මේ පනත යටතේ නිකුත් කරන ලද යම් සහතික පත්‍රයක්, අවසර පත්‍රයක් හෝ වෙනත් ලේඛනයක් නිකුත් කිරීම, වලංගුකරණය, පැවරීම, අලුත් කිරීම, සහතිකයක් දීර්ඝ කිරීම හෝ යම් සහතිකයකට, අවසර පත්‍රයකට හෝ වෙනත් ලේඛනයකට සිදු කරන යම් වෙනස් කිරීමකට සම්බන්ධ කාර්යපටිපාටිය, නියම සහ කොන්දේසි;

(එ) මාර්ග අවසර පත්‍රයක් ප්‍රදානය කිරීම සඳහා ඉල්ලුම්කරුවන් තෝරා ගැනීමේ නිර්ණායක සහ තෝරා ගැනීමේ ක්‍රියාවලිය;

(ඒ) මේ පනත යටතේ අය කරනු ලබන ගාස්තු සහ අය කිරීම්;

(ඔ) ප්‍රවාහන සේවා පන්ති වර්ගීකරණය, ප්‍රවාහන සේවා සපයන්නන් විසින් පවත්වාගෙන යා යුතු සේවා ප්‍රමිති සහ අදාළ ප්‍රවාහන රථවල විවිධ ගාස්තු තීරණය කරන ආකාරය සහ ඒ සඳහා වන කොන්දේසි;

(ඕ) ආරක්ෂිත, කාර්යක්ෂම සහ යාවත්කාලීන ප්‍රවාහන සේවාවක් සඳහා පහසුකම් සැලසීමට කොමිෂන් සභාව විසින් ඵලදායී ලෙස ක්‍රියාත්මක කළ යුතු යම් දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම සඳහා වන මාර්ගෝපදේශ;

(ක) ගාස්තු අය කිරීම සඳහා ඉලෙක්ට්‍රොනික ක්‍රම භාවිතයට අදාළ ප්‍රමිති සහ කොන්දේසි සහ ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතිය (GPS) ඇතුළු නව සේවාවන් ප්‍රසම්පාදනය;

(ග) පුහුණු මධ්‍යස්ථානය කළමනාකරණය;

(ච) අවසර පත්‍රයක් දරන්නකු විසින් පවත්වාගෙන යා යුතු සේවා ප්‍රමිතීන් සහ කොමිෂන් සභාව විසින් එකී ප්‍රමිතීන් අධීක්ෂණය කිරීම;

(ජ) ප්‍රවාහන සේවා සම්බන්ධයෙන් අදාළ වන ආචාර ධර්ම සංග්‍රහය සහ එකී ආචාර ධර්ම සංග්‍රහයෙන් යමක් උල්ලංඝනය කරනු ලබන අවස්ථාවක, කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන පරීක්ෂණයේ කාර්යපටිපාටිය;

(ට) නිකුත් කරනු ලබන අවසර පත්‍ර සහ සහතික පත්‍ර පරීක්ෂා කිරීමට අදාළ කොන්දේසි; සහ

(ඩ) බස් රථ සේවා සහ ප්‍රවාහන සේවාවල ආසන වෙන්කරවා ගන්නා ක්‍රමය සහ ආකාරය.”.

**25.** ප්‍රධාන ප්‍රඥප්තියේ 46ඌ වගන්තිය, එහි (1) වන උපවගන්තියේ “මගීන් හතලිහකට නොඅඩු සංඛ්‍යාවකට අසුන්ගත හැකි බස් රථයක් සම්බන්ධයෙන් පමණක්,” යන වචන වෙනුවට, “මගීන් හතළිහකට නොඅඩු සංඛ්‍යාවකට අසුන්ගත හැකි බස් රථයක් සම්බන්ධයෙන් සහ මගීන් විස්සකට නොඅඩු සංඛ්‍යාවකට අසුන්ගත හැකි වායු සමීකරණය කරන ලද බස් රථයක් සම්බන්ධයෙන් පමණක්,” යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 46ඌ වගන්තිය සංශෝධනය කිරීම

ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තිය සංශෝධනය කිරීම

**26.** ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) "ජනතාකරණය කරන ලද සමාගම" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණ ඇතුළත් කිරීමෙන්:-

""නියම කරන ලද" යන්නෙන්, නියෝග මගින් නියම කරන ලද යන්න අදහස් වේ;

"පළාත" යන්නෙන්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අටවන උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති පළාතක් අදහස් වේ;

"පළාත් සභාව" යන්නෙන්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154අ ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද පළාත් සභාවක් අදහස් වේ;";

(2) "නිශ්චිත ප්‍රදේශය" යන යෙදුමේ අර්ථ නිරූපණයේ "එවැනි ප්‍රදේශයක් අදහස් වේ." යන වචන වෙනුවට, "එවැනි ප්‍රදේශයක් අදහස් වේ;" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) "නිශ්චිත ප්‍රදේශය" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අර්ථ නිරූපණ එකතු කිරීමෙන්:-

""ප්‍රවාහන ගාස්තු" යන්නට, ප්‍රවාහන සේවා සැපයීම සඳහා අය කරනු ලබන ගාස්තුවක් හෝ කුලියක් ඇතුළත් වේ;

"ප්‍රවාහන සේවා" යන්නෙන්, මෝටර් හෝ මෝටර් නොවන ප්‍රවාහන සේවා විධියක් සම්බන්ධ වන ඇමතුම් සේවාවක් හෝ

ස්වාධීන සේවාවක් ඇතුළු කාර්යාල ප්‍රවාහන සේවා, පාසල් ප්‍රවාහන සේවා, ත්‍රීරෝද රථ සේවා යොදාගෙන පළාත් අතර යමින් ගාස්තුවක් අය කරමින් මගින් වෙත ගමන් පහසුකම් සහ පළාත් අතර භාණ්ඩ ගෙන යාම සැලසීම අදහස් වේ;

"ප්‍රවාහන රථය" යන්නෙන්, අන්තර් පළාත් මාර්ගස්ථ ප්‍රවාහන සේවා යොදාගනිමින් මගීන් සහ භාණ්ඩ ගෙන යාම සඳහා සාදන ලද යම් රථයක් අදහස් වන අතර, ඊට බස් රථයක් ඇතුළත් වේ;

"වාහනය" යන්නට, (203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනත යටතේ ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය.".

අනනුකූලතාවක් ඇති වූ විට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**27.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.